# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/37 - 2017 ජුනි මස 21 වැනි බදාදා - 2017.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : බීර්/ආර්4/5/1-1/749/06.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :එල්ඩී05/2007/එච්ඩබ්ලිව්/202.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 749 - කංකානම්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් කළුතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක. ක. 4394 පිඹුරේ කැබලි අංක. 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0049 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (01):

01. **කැබලි අංක. 1**

ඉඩමේ නම: තුණ්ඩුපට්ටියවත්ත, වරිපනම් අංක. 259, ගාලු පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. ඩී. මෙන්ඩිස් මහතා, හැනවත්ත, මොරගොල්ල, බේරුවල; ප්‍රමාණය: හෙක්. 0.0049.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2017.07.17 වැනි දින අනුව පෙරවරු 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017.07.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. ඩී. චතුර මල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 ජුනි මස 09 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 132



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.